**මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2023**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළයුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත් පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව.

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව විද්‍යායතනය ක්‍රියාකර ඇති බව.

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දින මිලදී ගෙන ක්‍රියාකාරී තත්ත්වයට පත්කර නොතිබූ (LMS) ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය වෙනුවෙන් රු.1,353,320ක චෙක්පතක් 2022 දෙසැම්බර් 31 දින නිකුත්කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 28 ඡේදයට පටහැනිව එම වර්ෂයේ අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් අස්පෘශ්‍ය වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. එම පද්ධතිය 2022 හා 2023 වර්ෂවලදී භාවිතාකර නොතිබියදී ප්‍රමිතියේ 96 ඡේදයට පටහැනිව ක්ෂය සඳහා ගැලපීම් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම රු.96,590 කින් හා සමුච්චිත ක්ෂය රු.97,649 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | 2022 දෙසැම්බර් 27 දින සිට වත්කමක් ලෙස ගිණුම්ගත කර ක්ෂය කරන ලදී. LMS පද්ධතිය සම්පූර්ණයෙන්ම සංවර්ධනය කර අවසන් වූ පසුව 2023 දෙසැම්බර් 27 දින අදාළ සැපයුම්කරුට ලබා දුන් බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 80 ඡේදය ප්‍රකාරව, වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව එළඹෙන මාස 12 ක කාලය තුළ දී නිදහස් කළ යුතු බැඳීම්, ජංගම වගකීම් ලෙස හඳුනාගත යුතුය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම යටතේ දැක්වෙන ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතු වටිනාකම තුළ ඇතුළත් රු.3,333,000 ක් වූ ජංගම නොවන වගකීම්, ජංගම වගකීම් යටතේ දැක්වීමෙන් ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද ජංගම නොවන වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ සිට ජංගම නොවන වගකීම් සහ ජංගම වගකීම් ලෙස හඳුනාගෙන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015 වර්ෂයේ සිට විශ්වවිද්‍යාල විද්‍යායතනය පවත්වා ගෙන යනු ලබන ඉඩම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | විද්‍යායතනය ස්ථාපිත කර ඇති ඉඩම මාතර ප්‍රාදේශීය ලේකම් විසින් නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය වෙත භාර දී ඇත. එම ඉඩමේ භුක්තිය අමාත්‍යාංශය යටතේ පවතින බැවින් විද්‍යායතනය පවත්වාගෙන යාමේ හා සංවර්ධන කටයුතු කිරීමේ කිසිදු බාධාවක් නොමැති බව අමාත්‍යාංශය මගින් දන්වා ඇති බව. | ඉඩම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

### 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.13,314,589 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.27,189,925 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,875,336ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රාග්ධන ප්‍රදාන වැඩිවීම, අගය හුවමාරු වන ගනුදෙනු ආදායම වැඩි වීම සහ වාර්ෂික ක්ෂය ප්‍රතිපාදනය අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පාඨමාලා මොඩියුලවලට අදාළව අවස්ථාවන් 21 කදී සැලසුම් කර තිබූ අනුමත දේශන පැය 1911 කින් පැය 1500 ක් ආවරණය කර නොතිබුණි. ඒ අනුව සැලසුම් කල දේශන පැය ප්‍රමාණයන් ආවරණය කිරීම දුර්වල මට්ටමක පැවැතීම හේතුවෙන් විද්‍යාර්ථයින්ට අවශ්‍ය දැනුම ප්‍රමාණාත්මකව ලැබෙන බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | මොඩියුලවල නියමිත පැය ප්‍රමාණයන් ආවරණය නොවීමට ඇතැම් බාහිර දේශකවරුන් විදෙස්ගත වීම, පෞද්ගලික හේතුන් මත ඉවත් වීම සහ පැයකට කරන ගෙවීම අඩුවීම හේතු වී ඇත. මොඩියුලවල නියමිත විෂය කරුණු ආවරණය කර ඇති බව. | විද්‍යාර්ථයින්ට දැනුම ප්‍රමාණාත්මකව ලබා ගත හැකි පරිදි සැලසුම් කළ පාඨමාලා පැය ගණන ආවරණය කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2015, 2017 හා 2018 වසර වලදී විලේපනවේදය පාඨමාලාව සඳහා බඳවා ගත් සිසුන් 35 දෙනෙකුගෙන් සිසුන් 24 දෙනෙකු හා 2019 සිට 2021 වර්ෂ තුලදී ආරම්භ කරන ලද පාඨමාලා 9ක් සඳහා බඳවා ගත් සිසුන් 824 දෙනාගෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට සිසුන් 95 දෙනෙකු පාඨමාලා හැර ගොස් තිබුණි. එම සිසුන් පාඨමාලාවන් හැර යාමට හේතු සොයා බලා රඳවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට කළමනාකරණයෙහි අවධානය යොමු කර නොතිබුණි. | 2019,2020 සහ 2021 වර්ෂවල ආරම්භයේ සිට කොවිඩ් 19, ආර්ථික අර්බුදය වැනි ගැටළු පැවති අතර සිසුන් විදෙස්ගත වීමේ ප්‍රවණතාවය හේතුවෙන් සිසුන් පාඨමාලා හැර යාමේ ප්‍රවණතාවයක් පවතී. දේශීය හා ජාත්‍යන්තර වශයෙන් NVQ සුදුසුකම ලබා ගැනීමේ වැදගත්කම සහ එයට ඇති ඉල්ලුම පිළිබඳව දරුවන් දැනුවත් කිරීම සියලුම දේශකවරුන් විසින් සිදුකරනු ලබන බව. | බඳවා ගන්නා සිසුන් රඳවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සිසුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා 2014 වර්ෂයේදී රු.1,250,000 ක් වැයකර මිලදී ගෙන තිබුණු Vehicle Hoist and wheel Alignment උපකරණය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | මෙම උපකරණය ස්ථාපනය කිරීම සඳහා ආසන්න වශයෙන් දිග අඩි 38, උස අඩි 20 හා පළල අඩි 15 පමණ ඉඩකඩ සහිත ගොඩනැගිල්ලක් අවශ්‍ය වේ. ආයතනයට විකල්ප ඉඩමක් ලැබුණු පසුව අදාල උපකරණ නිසි ප්‍රමිතියට අනුව සවිකිරීමට කටයුතු කරන බව. | නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර මිලදී ගත යුතු අතර මිලදී ගන්නා ලද උපකරණ අදාල කාර්යය සඳහා උපයෝජනය කල යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තා පිළියෙල කරමින් පවතින බව. | වාර්ෂික වාර්තාව පිළියෙල කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |